


11. තේමාව
වැඩ පහසු කිරීමේ මං









සැකසීම සහ මෙමෙයවීම : සමන් සර්

කුලි / ශාරිපුත්‍ර ප්‍රාථමික විද්‍යාලය
දුම්මලසූරිය

පිළිවෙළට හා ක්‍රමවත් ව වැඩ කිරීම මඟින් අපේ එදිනෙදා කාර්යයන් පහසු කර ගත හැකි ය. එමෙන් ම සාමූහික ව කටයුතු කිරීම වඩාත් ප්‍රතිඵලදායක ය. වැඩ පහසු කර ගැනීම සඳහා අතීතයේ මිනිසුන් විවිධ සරල ක්‍රම භාවිත කළ නමුදු වර්තමානයේ බොහෝ විට ඒ සඳහා නවීන ක්‍රම භාවිත කෙරේ. මේවා පිළිබඳ ව ගවේෂණාත්මක ව තොරතුරු හා අත්දැකීම් එකතු කිරීමටත්, විවිධ අයුරින් ඒවා වාර්තා කිරීමටත් මෙම තේමාව මඟින් ඔබට අවස්ථාව සලසා ඇත.

තනිව කළ නොහැකි බොහෝ දේ එකමුතුව කළ හැකිය











වර්තමානයේ නවීන උපකරණ යන්ත සූත භාවිතයෙන් කරන බොහෝ දේ අතතයේ මිනිසුන් එකමුත වී කළහ

මේ නිසා මිනිසුන් අතර සහයෝගතාවය ගොඩනැගුණු අතර එම කාර්යය වඩා හොදින් කරගැනීම ට ඔවුන්ට අවස්ථාව හිමිවිය

නමුත අද නවීන යන්ත සූත භාවිතය නිසා මිනිසුන් අතර එකමුතකම අඩු වී තබේ. එය මිනිසුන් එකිනෙකා දුරස් කර තබේ

අතීතයේ සිට වැඩ පහසු කර ගැනීම සඳහා විවිධ ක්‍රමශිල්ප යොදා ගත් අයුරු හා එම ක්‍රම ශිල්ප ක්‍රමයෙන් දියුණු කරගත් අයුරු

යම් බරක් ඔසවාගෙන යාම

↓

බිම දමා ලණුවකින් ගැට ගසා ඇදගෙන යාම

↓

ලැල්ලක් මත තබා ලණුවකින් ඇදගෙන යාම

↓

එම ලැල්ල යටට සිලින්ඩරාකාර කොට කැලි කිහිපයක් දමා ඇදගෙන යාම

↓

රෝද සවි කිරීම

අතීතයේ යමක් ඔසවාගෙන යමින් මිනිසුන් කළ කාර්යය අද වන විට රෝද භාවිතා කරමින් කිරීමෙන් පෙනී යන්නේ මිනිසුන් ක්‍රමයෙන් තම කාර්යයන් පහසු කර ගැනීමට විවිධ ක්‍රම භාවිතා කර ඇති බවයි

පහත අවස්ථා අතීතයේ සහ අද කරන ආකාරයේ වෙනස්කම් මතකයට නගාගන්න

- දුර ගමනක් යෑම
- සී සෑම
- ගොයම් කැපීම හා පෑගීම
- ධාන්‍ය ඇඹරීම
- පාරක් තැනීම

සී සෑම අතීතයේ සිට වර්ධනය වූ ආකාරය










පා පැදියක ක්‍රියාකාරීත්වය කෙබඳු ද?



පාපැදියක පසුපස රෝදයට සම්බන්ධ කර ඇති දැති රෝද යුගලයක රූපයක් පහත දැක්වේ

විශාල දැති රොදය

විශාල දැති රොදය



පැඩලය

කුඩා දැති රොදය

විශාල දැත රෝදය, කුඩා දැත රෝදය හා එම දැත රෝද වටා ඇත දම්වැල පා පැදිය ඉදිරියට යාමට දක්වන දායකත්වය කෙබඳුද


පා පැදියක ඉහත දැක්වෙන කොටස එකට සම්බන්ධ වී ක්‍රියාත්මක වේ


පැඩලය කරකැවීමේ දී විශාල දැත රෝදය එක් වටයක් කරකැවෙන විට කුඩා දැත රෝදය වට කිහිපයකින් කැරකැවෙන බව අපිට දැකගත හැකිය

කුඩා දැත රෝදය වට කිහිපයක් කැරකවෙන විට ඊට සම්බන්ධ වී ඇත පසුපස රෝදයද වට කිහහිපයක් කරකැවේ

එමගන් පා පැදිය අඩු වෙහෙසකින් යුතව ඉදිරියට යාමට සලස්වා තබේ

යම් බරක් සුමට පොළොවක් සහ රළු පොළොවක් මත තල්ලු කිරීම සහ ඇදීම සිදු කළ අයුරු සිහිපත් කරන්න. මෙයින් වඩාත් පහසු කුමන මතුපිටක් තුළ එය කිරීමටද?





100cm

150cm




ලොරියට වීල් බැරෝව තල්ලු කිරීමට පහසු 100 cm උසකද නැතිනම් 150cm උසකද යන්න සිතා බලන්න


මෙවැනි කාර්යයකදී තලයේ ආනත බව අඩු වන විට යමක් ඉහළට තල්ලු කිරීම පහසු වේ

බරක් ඉහළට එසවීම

- තරමක බර වස්තුවක් සපයා ගන්න.
- ප්‍රථමයෙන් එය වටා ලණුවක් ගැට ගසා එමගින් ඉහළට ඔසවා බැලමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න
- සිසුන්ට දැනෙන පරිදි එහි බර පිළබඳ ව ඔවුන්ගේ අදහස් විමසන්න.
- පසු ව එම භාරය සහිත ලණුව ලී හෝ ලෝහමය හෝ කප්පියක් වටා යවන්න.
- ලණුවේ නිදහස් කෙළවරින් පහළ දෙසට ඇදීමෙන් භාරය එසවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.



මෙම අවස්ථා දෙකෙන් වඩා පහසුවෙන් භාරය ඉහළට එසවූයේ කුමන අවස්ථාවේද?





බරක් කෙළින් ම ඉහළට එසවීමට වඩා කප්පියක් ආධාරයෙන් පහළ දෙසට ඇදීම වඩාත් පහසුය

එදිනෙදා කටයුතු කිරීමේ දී කප්පියක් යොදාගෙන වැඩ කරගන්නා අවස්ථා කීපයක් පෙළගස්වන්න



උදාහරණ


ලදෙන් වතුර ඇදීම

ඉදිකරන නිවසක උඩට බදාම පනිවිටුවක් ගැනීම

.....

.....

.....







වැඩ පහසු කරගැනීමට සරල උපක්‍රම භාවිතා කිරීම














පහත උපකරණ සපයාගන්න








ඉහත උපකරණ භාවිතා කරන්නේ කුමක් සඳහා ද

ගිරය	
කතුර	
අඬුව	


ඉහත උපකරණ ක්‍රියාත්මක වන්නේ කෙසේද?



කතුරක ක්‍රියාකාරීත්වය

අඬුවක ක්‍රියාකාරීත්වය

උපකරණය මගින් වස්තුව මත බලය යොදන ස්ථානය




බලය යොදන ස්ථානය (අතින් තෙරපීම)

කරකැවෙන සථානය (ලක්ෂය)

ගිරයක ක්‍රියාකාරීත්වය

උපකරණය මගින් වස්තුව මත බලය යොදන ස්ථානය



බලය යොදන ස්ථානය (අතින් තෙරපීම)

කරකැවෙන සථානය (ලක්ෂය)

එදා සහ අද ආලෝකය ලබාගත් ආකාරය









එදා

අද

විදුලි ආලෝකය ලාබාගැනීම නිසා නිවෙස හා මාර්ග ආලෝකමත් කිරීමේ දී එදා යොදාගත් ක්‍රමයට වඩා අද ක්‍රමය පහසු වී ඇති බව පෙනේ


බල්බය හඳුනා ගනිමු

වීදුරු ආවරණය

සූත්‍රිකාව

ලෝහ වැස්ම

ඊයම් අග්‍රය



ලෝහ කූරු

ටෝච් බල්බයක් හා LED බල්බයක් සපයාගෙන නිරීක්ෂණය කර බලන්න මේ සඳහා අත් කාචයද උපයෝගී කරගන්න

ඒ ඒ බල්බ වල ඇති සුවිශේෂතා හඳුනාගන්න

ටෝච් බල්බය	LED බල්බය
වීදුරු වැස්මක් ඇත	ලෝහ කූරු දෙකක් ඇත
ලෝහ වැස්මක් ඇත	ටෝච් බල්බය ට වඩා කුඩාය
ඊයම් අග්‍රයක් ඇත	
සූත්‍රිකාවක් ඇත	

නිවස පාසල හෝ වෙනත් එවැනි ස්ථාන ආලෝකමත් කිරීමට යොදාගන්නා බල්බ වර්ග







සාමාන්‍ය විදුලි බල්බ

LED බල්බ

ටියුබ් ලයිට්

වර්ණ බල්බ

ප්ලෑට් ලයිට්





හෝල්ඩරයකට බල්බයක් සවි කිරීමට ඔබට හැකිද?

නිවසේ වැඩිහිටියකුගේ උදව් ඇතිව උත්සාහ කර බලන්න

හෝල්ඩර් වර්ග දෙකකි

ස්ක්‍රෑව් (Screw) පොට සහිත

පින් (Pin)



නිවසේ හෝ වෙනත් තැනක විදුලියට සම්බන්ධ හෝල්ඩරයකට බල්බයක් දැමීමේ දී ප්‍රධාන පරිපථය (මේන් ස්විච්) විසන්ධි කරන්න රබර් පාවහන් පළඳින්න





බල්බයක් දල්වමු

සපයාගන්න

වියලි කෝෂ/වයර්/ටෝච් බල්බ හා LED බල්බ













ධන අග්‍රය

සෘණ අග්‍රය



බල්බයක් දැල්වීමේ
දී එහි ධන අග්‍රය
සෘණ අග්‍රය සහ
බල්බයේ ඊයම් අග්‍රය
සහ ලේහ වැස්ම
හොඳින් සම්බන්ධ
විය යුතුය





මේ ආකාරයට සම්බන්ධ කිරීමෙන් බල්බය දැල්වේදැයි ඔබත් පරීක්ෂා කර බලන්න

වැඩ පසහු කිරීම සඳහා චුම්බක යොදාගැනීම

ඒදිනෙදා කටයුතු කරගැනීමේ ඒවා වඩාත් පහසු කර ගැනීම සඳහා චුම්බක භාවිතා වන අවස්ථා තිබේ









ක්‍රියාකාරකම

චුම්බක වල ඇති ගුණ (ලක්ෂණ) කිහිපයක් හදුනාගැනීම සඳහා පහත ක්‍රියාකාරකම කරන්න

පහත දැක්වෙන ද්‍රව්‍ය සපයාගන්න

- දණ්ඩ චුම්බක 2 ක්
- ලෝහමය ද්‍රව්‍ය (හැට්ට කටු/ ඇණ/අල්පෙනෙති
- ලෝහමය නොවන ද්‍රව්‍ය (කඩදාසි/බොත්තම්/පැන්සල/මකනය
- යකඩ කුඩු

ඔබ සපයාගත් දෑ චුම්බක වෙත ළංකර සිදුවන දේ නිරීක්ෂණය කරන්න. ඒ ඇසුරින් පහත වගුව පුරවන්න

කාන්දමට ඇදගන්නා දේවල්	කාන්දමට ඇදී නොඑන දේවල්





චුම්බක දෙකක් පහත ආකාරයට මේසය මත තබා ළං කර බලන්න.සිදුවන දෙය ලියන්න

1





2





3



චුම්බක වල සමාන අග්‍ර (පැති) ළං කිරීමේදී විකර්ෂණය වන බවත් විරුද්ධ අග්‍ර ළං කළ විට ආකර්ෂණය වන බවත් ඔබට දැකගත හැකිය

ක්‍රියාකාරකම

කඩදාසියක් මත අල්පෙනෙති ඇමුණුම් කටු හෝ යකඩ කුඩු විහිදුවා දමන්න. ඉන්පසු ඒ මත දණ්ඩ චුම්බකයක් එහා මෙහා ගෙනයන්න.සිදු වූ දේ යටින් ලියන්න. අඳින්න

දණ්ඩ චුම්බකයක ද්‍රව්‍ය ආකර්ෂණය වන්නේ එහි දෙකළවරටයි

විද්‍යුත් චුම්බකයක් සාදමු

යකඩ ඇණයක් ගෙන එයට කොයිල් කම්බි ඔතා රූපයේ ආකාරයට සකස් කර ගන්න එය වියලි කෝෂයකට සම්බන්ධ කර නිරීක්ෂණය කරන්න



- මෙහි වියලි කෝෂ ගණන වැඩි කිරීමෙන් කුමක් විය හැකිද?
- කොයිල් කම්බි වෙනුවට යොදාගත හැකි වෙනත් දෙයක් ලියන්න
- මෙහි චුම්බක බලය වැඩිඩිකරගැනීමට කළ හැකි යෝජනා මොනවාද

- ඕනෑම වැඩක් කිරීමේ දී සැලසුම්ගත ව, ක්‍රමවත් ව හා පිළිවෙළට කටයුතු කිරීමෙන් කාලය හා ශ්‍රමය ඉතුරු කරගත හැකි ය

උදා

පාසල් නිල ඇඳුම, පොත්, සපත්තු/පාවහන් ආදිය ක්‍රමවත් ව නිසි ස්ථානයක තැබීම මගින් පාසල් යාමට සූදානම්ම වීමේදී පහසුවක් සැලසේ

එවැනි ජීවන රටාවකට කුඩා කල සිටම ඔබ පුරුදු පුහුණු වීමෙන් නිවසේ වෙසෙන අන් අයගෙන් මෙන් ම මුළුමහත් සමාජයෙන්ම ප්‍රසංසා ලැබීමට ඔබට හැකිවේ

එමෙන් ම යම් පුද්ගලයකුගෙන් හෝ ස්ථානයකින් හෝ සේවාවක් ලබා ගැනීමේ දී හා ලබා දීමේ දී ආචාරශීලී ව, නීතිගරුක ව හැසිරීමට දුවේ පුතේ පුරුදු වෙන්න

එවැනි යහපුරුදු ඔබේ කටයුතු පහසු කරගැනීමට උපකාරී වේ

ජනකවි





අතීතයේ සිට මිනිසුන් විවිධ කාර්යයන් කිරීමෙන් ඇතිවන වෙහෙස නිවා ගැනීම සඳහා කවි ගායනා කළා

- ❑ ගොයම් කැපීම
- ❑ පතල් වැඩ කිරීම
- ❑ පැල් රැකීම
- ❑ පාරු පැදීම
- ❑ ගැල් පැදවීම

ගොයම් කවි

ඉරු දෙවියන් ගේ ඉර ගල ගාවා
සඳ දෙවියන් ගේ සඳ ගල ගාවා
ගණ දෙවියන් ගේ කෝවිල ගාවා
අපිත් කියමු කවි ගොවිපළ ගාවා

රන් දැකැති ගෙන නිති සැරසෙනවා
රත්රන් පටි ඉණ වට දිලිසෙනවා
රිවිදුටු පිනි බිඳු ලෙස පහ වෙනවා
දුම්බර කෙතෙ අපි ගොයම් කපනවා

මෙවැනි ජනකවි එකතු කරපුංචි පොතක් සාදන්න

ඔබට විශිෂ්ට ජයක් තෙරුවන් සරණයි!

ඔබේ ආදරණීය ගුරුතුමා
සමන් සර්

msofficeskills.com